# ආයතනයේ පර්යේෂණ හා පුහුණු කිරීමේ කටයුතු

*ආරියපාල සිරිවර්ධන

## බැම්ණිවත්ත කෘෂිකාර්මික පලද වර්ධන කම්වු ප්‍රදේශය පිළිබඳ සමාජ – ආර්ථික සමීක්ෂණය:

"ගොවි ජනතාව" සඟරාවේ කලින් කලාපවලදී කිහිප වාරයක්ම සඳහන් කළ හැටියට කෑගල්ල දිස්ත්‍රික්කයේ බැම්ණිවත්ත කෘෂි-කාර්මික කම්වු ප්‍රදේශය ආයතනයේ ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය හැටියට තෝරාගෙන තියෙනව. මේ ප්‍රදේශයේ ගම් දියුණු කරන්න ඉහළ මට්ටමින් නොයෙකුත් වැඩපිළිවෙලවල් ගැන සළකා බලන කොට, පහළ මට්ටමින් සිදු කරල තියෙන ගැඹුරු අධ්‍යයන හුහක්දුරට රුකුලක් වෙනව. බැම්ණිවත්ත ප්‍රදේශය තෝරා ගන්න එක හේතුවක් වුනෝ, මෙපමණ කාලයක් තිස්සේ තෙන් කලාපයේ සමාජ–ආර්ථික අංශයන් ගැන ගැඹුරු අධ්‍යයන ඉටු කරන්න උත්සාහයක් දරා නොතිබීමයි. රජය වත් පුද්ගලික ආයතනවත් ප්‍රදේශයේ දියුණුව සඳහා විශේෂ යෝජනා ක්‍රම වෙතෙක් මේ ප්‍රදේශයේ ආරම්භ කරල තිබුනෙ නැහැ. පර්යේෂණ මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ පර්යේෂණ වැඩ කටයුතු අනුසාරයෙන් නොයෙකුත් ක්‍රියාත්මක වැඩසටහන් දියත් කිරීම ආයතනයේ එක පරමාර්ථයක්. ගෙවතු වගා, සත්ව පාලනය, සාමූහික නිෂ්පාදනය, තෝරා ගත් පෙදෙස්වල උස් බිම් සංවර්ධනය ආදිය ඇතුළත් පුළුල් වැඩපිළිවෙලක් දැන් මේ ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙනව.

මේ අතරතුර බැම්ණිවත්ත පලද වර්ධන කම්වු ප්‍රදේශයේ කෘෂිකාර්මික හා සමාජ–ආර්ථික තත්ත්වයන් පිළිබඳව වැදගත් තොරතුරු රැස් කිරීම අරමුණු කරගෙන ආයතනය සමාජ–ආර්ථික සමීක්ෂණයක් පැවැත්වූවා.

මේ සමීක්ෂණයේ තවත් අරමුණක් වුනෝ ගොවි ජනතාවට මුහුණ දෙන්නට සිදු වන ගැටළු මතු කර ගැනීමයි. සංවර්ධන වැඩ සටහනක් දියත් කිරීමේදී ඕනෑ කරන වැදගත් කරුණු ගණනාවක් සමාජ–ආර්ථික සමීක්ෂණයෙන් හෙළිදරව් වුනා. පහත දක්වා ඇත්තේ ඒවායින් හුහක්ම වැදගත් විය හැකි සාධකයි.

- අධ්‍යයනයට යොමු වූ ප්‍රදේශයේ ඉඩම් හිඟය ගොවිතැන් දියුණුවට ඇති බාධාවක්. විශේෂයෙන් තලාපිටිය, හරන්කහව, මාවාත සහ පල්ලිපෝරුව කියන ගම්වල ඉඩම් හිඟය උග්‍රව පවතිනවා. ජනගහණය වැඩිකම, ගොවිතැන් කටයුතු කළහැකි ඉඩම් අඩුකම, ගම්වැසියන් අතර ඉඩම් සාධාරණව බෙදී නොතිබීම ආදිය නිසයි, මේ තත්ත්වය ඇති වෙලා තියෙන්නෙ.

- හුහක් ගම්වල කුඹුරු ගොවිතැන ගැන සළකන කොට අඳ ගොවි තත්ත්වය, නොයෙකුත් විදියෙ හවුල් අයිතිය සහ ඉතා කුඩා කුඹුරු කට්ටි අයිතිය තිබීම දක්නට ලැබෙනව.

- ප්‍රදේශයේ අඳ ගොවින්ගෙන් වැඩි දෙනෙක් නියමිත හතරෙන් එකක අඳ කුලිය නොව අස්වැන්නෙන් බාගයක් තමන්ගෙ කුලිය හැටියට ඉඩම් හිමියන්ට ගෙවනව. ඇමහර අඳ ගොවීන්ට ඉඩම් හිමියන්ගෙන් බීත්තර වී, පෝර හා කෘමි නාශක ද්‍රව්‍ය ආදිය ලැබී තියෙනව.

- ප්‍රදේශයේ වැඩි වශයෙන් කර ඇත්තේ ගොඩ ගොවිතැන බව සමීක්ෂණයෙන්

---

* ප්‍රවෘත්ති ප්‍රකාශන නිලධාරි, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

හෙළිදරව් වී තියෙනව. මෙහි ඇති වැවිලි කර්මාන්ත අතුරින් රබර්වලට වැදගත්තැනක් හිමි වුනත් රබර් වතු හොඳින් පාලනය කර නැති බව පෙනී ගියා.

- තැනින් තැන පිළිවෙලකට නැතිව කෙසෙල් හා සුළු අපනයන බෝග ආදිය වගා කර තියෙනව. ක්‍රමානුකූල සංවර්ධන වැඩසටහනක් මගින් මෙම වගාවන් දියුණු කිරීමෙන් ආර්ථිකමය වශයෙන් වාසි ලබා ගන්නට පිළිවනි.

- මෙම ප්‍රදේශයෙහි සම්ප්‍රදායික වශයෙන් වී ගොවිතැන කරගෙන යනු ලැබුවත් එනයින් ලැබෙන අස්වැන්න රටේ සාමාන්‍ය අස්වැන්න හා සසඳන කළ ඉතාමත් අඩුයි. කුඹුරු ඉඩම් කැබලි කට්ටි කැඩී යාම ප්‍රදේශයේ දක්නට ලැබෙන එක් ප්‍රශ්නයක්.

- ඉඩම් කට්ටිවල කුඩා බව, ස්ථිරව ජලය නොලැබීම, සේවා පහසුකම් කාර්යක්ෂමව නැතිකම සහ වගා පිළිවෙත් අනුගමනය කිරීම සඳහා ගොවීන් හට ප්‍රමාණවත් මුදලක් නොමැතිකම ආදී කරුණු නිසා දියුණු ශිල්ප ක්‍රම අනුගමනය නොකිරීමේ හා පලදායිතාවය අඩු වීමේ නැඹුරුතාවයක් දක්නට තිබෙනවා.

- බැමිණිවත්ත කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු ප්‍රදේශයේ ඉඩම් නැති කෘෂිකාර්මික කම්කරුවන්ගේ සංඛ්‍යාව සමහර ගම්වල ඉතාමත් අධිකයි. මෙවැන්නෝ තාවකාලික රැකියාවන් සොයා වරින් වර වියළි කලාපයට යෑම මෙම ගම්වල දක්නට ලැබෙන පොදු දෙයක්.

- ශ්‍රම හමුදවට අළුතින් එකතු වී ඇති වයස අවුරුදු 14–25 තරුණ තරුණියන් අතර රැකිරක්ෂා ප්‍රශ්නය උග්‍ර බවට පත් වී තිබෙනව.

- කෘෂිකාර්මික සංවර්ධනයේදී සැහෙන වැඩ කොටසක් ඉටු කර එක් එක් ආයතන අතර සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීමට ප්‍රදේශයේ ඇති විවිධ සේවා සමුපකාර සමිති, මැතදී පිහිටුවන ලද පලදා වර්ධන කමිටු සහ අළුතින් ඇති කරන ලද ගොවිකාරක සභා එතරම් සාර්ථක ලෙස කටයුතු කර නැති බව පෙනී ගියා.

- ප්‍රදේශයේ වගා කරනු ලැබෙන වී, කෙසෙල්, රබර්, පොල්, තේ, ගම්මිරිස්, සහ සාදික්කා යනාදී ද්‍රව්‍ය අලෙවි කිරීමේදී වී හැරන්නට අතිකුත් සියළුම නිෂ්පාදන වැඩි වශයෙන් පත් වන්නේ පෞද්ගලික වෙළෙඳුන් අතටයි. මේ නිසා ගොවීන් හට තම නිෂ්පාදනවලට තරඟකාරී මිළක් නොලැබෙන බව මෙම සමීක්ෂණයෙන් පෙනී ගොස් තිබෙනවා.

අධ්‍යයනයෙහිදී ඉස්මතු වුන මෙම ගැටළු සම්බන්ධයෙන් සුදුසු පටිදි කටයුතු කිරීම සඳහා නිර්දේශද අධ්‍යයනයෙන් පෙන්වා දී තිබෙනව. පහත සඳහන් කර ඇති එම නිර්දේශ බැමිණිවත්ත පලදා වර්ධන කමිටු ප්‍රදේශයේ සංවර්ධනය සඳහා වැඩපිළිවෙලක් යොද ගැනීමේදී වැදගත් වෙන්න පුළුවනි.

**කෙටිකාලීන හා මධ්‍යකාලීන:**

- ගොඩ ගොවිතැනෙහි අඩු පලදායිතාවය ගැටළුවක් හෙයින් වැඩියෙන් ආදායමක් ගෙන නොදෙන පුවක් වැනි බෝග වර්ග ඉවත් කර සුළු අපනයන බෝග හා ආහාර බෝග වැවීමට ක්‍රමානුකූල වැඩපිළිවෙලක් සකස් කළ යුතුයි. මේ සමහම ප්‍රවාහනය, අලෙවිය හා ගබඩා ආදී පහසුකම් සපයා දීමට කටයුතු සැළසිය යුතුයි.

- සත්ව පාලනය දියුණු කිරීම සඳහා පශු වෛද්‍ය පහසුකම්, ණය පහසුකම් හා අලෙවි පහසුකම් ආදියෙන් යුත් කෙටිකාලීන හා දීර්ඝකාලීන වැඩසටහන් දියත් කිරීමෙන් ගොවීන් හට එය අතිරේක ආදායම් මාර්ගයක් වීමට පිළිවනි. මෙයින් රැකියා අවස්ථාද තව තවත් වැඩි කර ගත හැකිය.

- තනිකරම රබර් සහ පොල් වගා කර ඇති බොහෝ ඉඩම්වල වගාව පාලනය කර නැති හෙයින් ඒවායින් ලැබෙනුයේ අඩු ආදායමක්. නැවත පැල සිටුවීම, පොර දැමීම ආදිය මගින් රබර් හා පොල් වගාව දියුණු කළහැකි අතර කුඩා ප්‍රමාණයක දක්නට ලැබෙන පහත් ආදායමක් ගෙන දෙන තේ වගාවන් වෙනුවට පළතුරු, සුළු අපනයන බෝග හා තෘණ ආදිය වැවීමට පිළිවන.

- ගොඩ ගොවිතැන සඳහා ණය ක්‍රමයක් නොමැතිකමද එම වගාව පරිහානියට පත් කරවන සාධකයකි. අනිවාර්ය ඉතිරි කිරීම් හා රක්ෂණය ආදි කරුණු සම්බන්ධ කර ගොඩ ඉඩම් වගාවන් සඳහා ණය යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කිරීමෙන් මෙම තත්ත්වය දියුණු කරන්නට පුළුවනි.

**දීර්ඝකාලීන:**

- ඉඩම් කැබලිවලට කැඩී යාම ප්‍රදේශයෙහි සංවර්ධනයට අහිතකර සාධකයක් හෙයින් ඉඩම් ඒකාබද්ධ කිරීම හා සාමූහික නිෂ්පාදන ක්‍රම ආදිය මගින් මෙම තත්වය මඟ හරවා ගත යුතුය.

- බැම්ණිවත්ත පලදා වර්ධන කමිටු ප්‍රදේශයෙහි ජනගහණ වර්ධනය අධිකව පවතින හෙයින් දැනට පවතින සම්පත්, සුභසාධක කටයුතු හා සේවා අවස්ථා කෙරෙහි මෙය පීඩනයක් වන්නට පිළිවන. එහෙයින් පවුල් සැළසුම් පිළිබඳ පුළුල් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

**තෝරා ගත් දිස්ත්‍රික්ක පහක වී ගොවිතැන ආශ්‍රිත ගොවිකටයුතු තත්ත්වය – තුලනාත්මක අධ්‍යයනය:**

හම්බන්තොට, පොළොන්නරුව, අනුරාධපුරය, මහනුවර සහ කොළඹ දිස්ත්‍රික්ක පහේ වී ගොවිතැන පිළිබඳ ගොවිකටයුතු තත්ත්වය ගැන ආයතනය සමීක්ෂණයක් කළා. එක එක දිස්ත්‍රික්ක ගැන සමීක්ෂණයෙන් හෙළි දරව් වුන කරුණු වෙන වෙනම ප්‍රකාශන හැටියට පිළියෙල කර තියෙනව. අවසානයේදී දිස්ත්‍රික්ක පහ තුලනාත්මකව සංසන්දනය කරල වාර්තාවක් සකස් කළා. ඒ වාර්තාවේ දැක්වෙන වැදගත් කරුණු කිහිපයක් තමයි කෙටියෙන් පහත දක්වා තියෙන්නෙ:

- ගොවිතැන් කටයුතුවලදී එක පවුලකින් ලබාගත හැකි ශ්‍රමික සංඛ්‍යාව අතින් වැඩි වාසි ලැබෙන්නෙ තෙත් කලාපයටයි.

- ඉතා කුඩා කුඹුරු කට්ටි සහ අඳ ගොවි ක්‍රමය හුහක්දුරට තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්කවල දක්නට ලැබෙනව.

- තෙත් කලාපීය දිස්ත්‍රික්කවල ඇතැම් ඉඩම් හිමියන් වගා කටයුතුවලට යන වියදම්වලදී අඳ ගොවීන්ට උදව් වන හෙයින් අඳ ගොවිහු අස්වැන්නෙන් බාග යක් ඉඩම් හිමියන්ට කුලිය වශයෙන් දෙති.

- සියළුම දිස්ත්‍රික්කවල කුඹුරු පනත සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොවේ.

- අනුරාධපුර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල වාහක බලය හිඟවීම නිසා අඩු පලදායිතාවයක් හා කලට වේලාවට වගා නොකිරීම සිදු වේ.

- වියලි කලාපයෙහි ගොවීන්ගෙන් වැඩි දෙනෙක් සිය ආදායම වී ගොවිතැනෙන් ලබා ගනිත්. මෙම කලාපයෙහි කුඹුරු කට්ටිවල ප්‍රමාණයද සෑහෙන්නට විශාල හෙයින් සෑහීමකට පත් විය හැකි ආදායමක් ඔවුනට ලබා ගත හැකිය.

- වී ගොවිතැන් කරන අය අතුරින්, අඳ ගොවීහු සහ කුඩා ඉඩම් කට්ටි වගාකරන ගොවීහු අඩු ආදායමක් ලබත්.

- පොළොන්නරුවේ හැරෙන්නට අනිකුත් දිස්ත්‍රික්කවල ණය ලබා ගැනීමේදී වැඩියත් විශ්වාසය තබා ඇත්තේ ආයතන කෙරෙහි නොව පෞද්ගලික මාර්ග කෙරෙහිය.

**පුහුණුකිරීමේ කටයුතු:**

පර්යේෂණ කටයුතු වගේම ගොවි කටයුතු අංශයේ පුහුණුකිරීමේ කටයුතු ආයතනය වැදගත් කොට සළකනව. මේ කාර්යයෙහිදී වරින් වර පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, දේශන ආදිය පැවැත්වීමට කටයුතු පිළියෙල කර තියෙනව.

අවුරුද්ද මුලදීම මඩකලපුව පැවැත්වුනු ගොවි හමුව ආයතනය පැවැත්වූ තුන්වන ගොවි සමුළුවයි. මෙහිදී හම්බන්තොට, මොණරාගල, අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක පහෙන් තෝරා ගත්ත ගොවි මහතුන් මඩකලපුවේදී රැස් වෙලා, 'ගොවිතැන් කටයුතු වලින් වැඩි පලදවක් ලබා ගැනීමට ඇති බාධා' යන මැයෙන් වූ මාතෘකාව යටතේ අදහස් හුවමාරු කර ගත්තා. මෙම සම්මන්ත්‍රණයට කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්, මඩකලපුවේ දිසාපති, ආයතනයේ අධ්‍යක්ෂ, ග්‍රාමීය ආයතන හා පලදා වර්ධන නිති අංශයේ අධ්‍යක්ෂ හා ඇතැම් දිස්ත්‍රික්කවල දිසාපතිවරුනුත්, කෘෂිකර්ම, ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු, සමුපකාර ආදී ආයතනවල නිලධාරීනුත් සහභාගි වුනා. මෙහිදී වැදගත් වශයෙන් දැක්වුනු අදහස් කිහිපයක් පහත සඳහන් වෙනවා.

- මෙම දිස්ත්‍රික්ක පහේම ඇති පුංචි වැව් ප්‍රතිසංස්කරණය කිරීමෙන් ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය ජලය කරදරයක් නැතිව ලබා ගැනීමට පුළුවන් බව ගොවි මහතුන්ගේ අදහස වුනා.
- වැව් නඩත්තු කිරීමේ වැඩ කටයුතු ගොවිකාරක සභාවලට භාර දිය යුතු යයි ගොවි මහතුන් අදහස් කළා.
- ආයතන වලින් දෙනු ලැබෙන ණය කලට වේලාවට නොලැබෙන හෙයින් ගොවි මහතුන් පෞද්ගලික මාර්ග වලින් වැඩි පොලියකට ණය ලබා ගැනීමට නැඹුරු වෙනවා. දැනට දෙනු ලැබෙන ණය ප්‍රමාණය වැඩි කළයුතුයි.
- කුඹුරු ගොවිතැන් පමණක් නොව ගොඩ ගොවිතැනටද සහනාධාර හා ණය ක්‍රමයක් සකස් කිරීම වැදගත්.
- ගොවිතැන් කටයුතුවලට නොව අනිකුත් ප්‍රවාහන ආදී කටයුතු සඳහා ට්‍රැක්ටර් පාවිච්චි කිරීම ගොවීන්ට මුහුණ දීමට සිදු වන එක් බාධාවක්. විශේෂයෙන් ට්‍රැක්ටර් යනාදියට අවශ්‍ය අමතර කොටස් පලදා වර්ධන කම්ටුවල ගබඩා කර තැබීමෙන් ගොවීන්ට සහනයක් සැලසෙනවා.
- කටු කම්බි, උදළු වැනි ගොවිතැන් ද්‍රව්‍ය දැනට සිදු වන පරිදි සමුපකාරයෙන් නොව කෘෂිකර්ම පලදා වර්ධන කම්ටු වෙන් නිකුත් කිරීමට කටයුතු කළයුතු යයි ඇතැම් ගොවි මහතුන් අදහස් කළා.
- බිත්තර වී ගොවීන්ගෙන් අඩු මිළකට ලබාගෙන රජය විසින් එම ගොවීන්ටම වැඩි මිළකට ඒවා විකිණීම සාධාරණ නොවන බව ගොවි මහතුන් අදහස් කළා. ඔවුන් කියා සිටියේ වී නිෂ්පාදනය කරන ගොවි මහතුන්ට කරන සේවයක් වශයෙන් ගොවි මහතුන්ගෙන් ලබා ගන්නා මුදලටම බිත්තර වී ඒ අයටම ලබා දිය යුතු බවයි.
- මොණරාගල දිස්ත්‍රික්කයේ ඉඩම් නැති ගොවීන් වැඩි දෙනෙක් සිටින හෙයින් ඔවුන්ට ඉඩම් ලබා දිය යුතුයි.
- වී මිළයට ගැනීමේදී තෙතමනය මැනීම සඳහා මීටරයක් පාවිච්චි කිරීමට වී අලෙවි මණ්ඩලය අනුගමනය කරන ක්‍රමය ගොවීන්ගේ විවේචනයට ලක් වුනා. මෙම මීටරය ක්‍රියාත්මක කරන අන්දම පිළිබඳව ගොවීන්ට දැනුමක් නැති හෙයින් නොයෙකුත් අක්‍රමිකතාවයන් සිදු වන බව ඔවුන්ගේ අදහස වුනා.
- බොහෝ සමුපකාරවලට ගබඩා පහසුකම් නොතිබීමෙන් ගොවීන්ගෙන් වැඩි දෙනෙක් පෞද්ගලික වෙළෙඳුන් හට වී

විකිණීමට පෙළඹෙන බව සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් වුනු තවත් අදහසක්.

- බඩ ඉරිඟු, කුරක්කන්, මයියොක්කා, ඉදල් ඉරිඟු ආදී ද්‍රව්‍යය සඳහාද සහතික මිළ ක්‍රමයක් තිබිය යුතුයි.

- වාර්ෂිකව සම්පාදනය කරනු ලබන දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන අනුව ගොවි නිෂ්පාදන මිළයට ගැනීම, ප්‍රවාහනය බෙදා හැරීම ආදී කටයුතුද සකස් කළ යුතුයි.

- තවත් ඉතාමත් වැදගත් කාරණයක් හැටියට ඉදිරිපත් වුනේ රජයේත් ආයතනවල සේවක සේවිකාවන්ටත් විශ්‍රාම වැටුප් හා අර්ථ සාධක අරමුදල් යෝජනා ක්‍රමවලින් ලැබෙන සහන තිබියදීත් රටෙහි ජීවනාලිය ලෙස සැළකිය හැකි ගොවි ජනතාවට සමාජයීය වශයෙන් සුරක්ෂිත භාවයක් නොතිබීමයි. මේ නිසා රජයට විකුණන සෑම වී බුසලකින්ම ශත -/50 ක් අඩු කරගෙන ගොවි අර්ථ සාධක අරමුදලක් පිහිටුවීමට එය උපකාරී කර ගත යුතු බව ගොවීන්ගේ අදහස වුනා. මෙයට අමතරව ශත -/60ක මුදලක් රජයට දයක විය හැකිය. දේශීය ආදයම් වශයෙන් රජයට ලැබෙන අරමුදලින්ද කොටසක් මෙම ගොවි අර්ථසාධක අරමුදලට යොදවා ගොවීන් හට සහන සැළසෙන කටයුතු කළයුතු බව ගොවි මහතුන් බොහෝ දෙනෙක් කියා සිටියා.

**ජනාවාස පුහුණුව පිළිබඳ සම්මන්ත්‍රණය:**

ගත වූ අවුරුදු තුන ඇතුළත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම යටතේ 170 ක් පමණ වන ජනාවාසවල තරුණ තරුණියන් 20,000 කට අධික සංඛ්‍යාවක් සේවය කරනවා. මෙම ජනාවාස වලින් අපේක්ෂා කරන පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා මේ අයට හොඳ පුහුණුවක් ලබා දීම ඉතාමත් වැදගත්. ඔවුනට ලබා දිය යුතු පුහුණුව ගැන සොයා බැලීම සඳහා නොබෝද ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් සම්මන්ත්‍රණයක් පැවැත්වූවා. මෙම සම්මන්ත්‍රණයට කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ඇතුළු අනිකුත් අදළ දෙපාර්තමේන්තු හා ආයතනවල නිලධාරීන් මෙන්ම ජනාවාසවල කණ්ඩායම් නායකයින් හා ජනාවාසිකයින්ද සහභාගී වී ජනාවාසවලදී යොද ගත යුතු පුහුණුව පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. එහිදී පහත සඳහන් නිගමනයනට එළඹීමට පුළුවන් වුනා.

- ජනාවාසවල පුහුණුවන්නන් සහ පුහුණුව කරවන්නන්ට පුහුණු පාඨමාලා සකස් කිරීමේදී ඒවාට අදලවන විෂය මාලාව ක්‍රමවේදය සහ ආධාර උපකරණ පිළිබඳ කරුණු නිගමනය කර ගැනීම සඳහා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යන සංවිධානයන්හී ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් හා පොල් පර්යේෂණ මණ්ඩලය, රබර් පර්යේෂණ මණ්ඩලය සහ තේ පර්යේෂණ මණ්ඩලයේද ශිල්පීය නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවිය යුතුය.

- පුහුණු පාඨමාලාවල විෂයයන් තීරණය කිරීමේදී පුහුණුව ලබන අයගේ (ජනාවාසිකයින්, කණ්ඩායම් නායකයින්, ක්ෂේත්‍ර සහකරුවන් සහ ඉඩම් ප්‍රති සංස්කරණ කොමිෂමේ පුහුණු කරවන්නන්) අධ්‍යාපනික මට්ටම් සහ ජනාවාස පිහිටා ඇති විවිධ කෘෂි දේශගුණික කලාප පිළිබඳවද සැළකිලිමත් විය යුතුය.

- පළමුකොටම පුහුණුව ලබා දිය යුත්තේ කෘෂි දේශගුණික පදනමක් මත තෝරා ගත් පුහුණු කරවන්නන් හටය.

- ශිල්පීය, ශිල්පීය නොවන, කළමනාකාරිත්ව, දේශපාලනික සහ සංස්කෘතික අංශ විෂය මාලාවට ඇතුළත් විය යුතුය. බෝග වැවීම, සත්ව පාලනය, පස් සංරක්ෂණය, ජලය පාලනය, මූල්‍ය කළමනාකරණය සහ ගිණුම් ආදී වශයෙන්

වන ශිල්පීය පුහුණුව හැකිතාක්දුරට කාර්යයෙහි යොදවා කරවන පුහුණුවක් විය යුතු අතර එය ගැටළු සොයා බලා ඒවා විසඳීමට යෝජනා ඉදිරිපත් කරන ආකාරයෙන් විය යුතුය.

❁ විවිධ කෘෂි දේශගුණික කලාපවලින් තෝරා ගනු ලබන ජනාවාස, පුහුණු කරවන්නන් පුහුණු කිරීම සඳහා පදනම් කරගත යුතු වේ.

❁ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා අනිකුත් අදාළ ආයතන විසින් යෝග්‍ය පුහුණු ආධාර උපකරණ සැපයිය යුතුයි.

❁ සාමාජික සාමාජිකාවන් 20,000 කින් පමණ සමන්විත ජනාවාස 170 විවිධ කෘෂි දේශගුණික කලාපවල පිහිටා තිබීම සැළකිල්ලට ගත් කළ පුහුණුව අවශ්‍යයෙන්ම විමධ්‍යගත කළයුතු අතර තෝරා ගත් පදනමක් මත පුහුණු වන්නන්ගේ ප්‍රමුඛතා ලැයිස්තුවක් පිළියෙල කර ගත යුතුය.

**අවසාන ගොවි හමුව:**

ආයතනය විසින් පවත්වනු ලබන ගොවි සමුළු මාලාවේ අවසාන ගොවි හමුව අප්‍රියෙල් මස අග භාගයේදී මහනුවර පැවැත්වීමට යෝජිතය. මෙම සමුළුවට කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමාද සහභාගි වීමට අපේක්ෂිතය.